**ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.2 වගුවෙහි ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 12 ක්ද, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

### 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම්කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වාගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 249 - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2019 පෙබරවාරි 01 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 සිට 2.9 දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම්කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ගණන්දීමේ නිලධාරීගේ ගිණුම්කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/ හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. අයවැය ඇස්තමේන්තු තාත්වික ලෙස පිළියෙල නොකිරීම.<br>2. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු.<br>3. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම. | 2.5(අ)(ආ)<br>2.9<br>2.2 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව. | පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු. | 2.8 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල්, බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කිරීම නියමිත | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.4 |

රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව.

**මුදල් රෙගුලාසි 128(2) රාජ්‍ය ආදායම් ගණන්දීමේ නිලධාරීගේ ගිණුම්කටයුතුභාවය**

-----------------------------------------------------

| | | | |
|---|---|---|---|
| 128(2)(අ) | ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු සම්පූර්ණ ලෙසත්, හැකිතාක් නිවැරදිවත් පිළියෙල කිරීම. | අපේක්ෂිත ආදායම රැස්කිරීමට නොහැකිවීම/ රැස්කළ හැකි ආදායම වැඩිවීමකදී හෝ අඩුවීමකදී ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට පියවර නොගැනීම. | 2.6(අ) (i)<br>2.6(ආ)(i)<br>2.6 (ඇ) (i)<br>2.6 (උ) 2.6 (ඕ) |
| 128(2)(ඈ) | එකතු කර ගැනීම සම්බන්ධයෙන් තමා වගකීමට බැඳී ඇති රාජ්‍ය ආදායමෙන් යම් කොටසක් වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මගින් එකතු කරනු ලැබේනම්, ඒ දෙපාර්මේන්තුවලින් හා කාර්යාලවලින් වාර්තා ලබාගෙන ඒවායේ සඳහන් කරුණු, රාජ්‍ය ආදායම් ඇස්තමේන්තුවලට ද පිළිවෙලින් පූර්වෝක්ත (අ), (ආ) සහ (ඇ) ඡේද ප්‍රකාරව තමා විසින් පිළියෙල කරන රාජ්‍ය ආදායම් ගිණුම්වල හා වාර්තාවල ද අන්තර්ගත කරන බව. | ආදායම් රැස් කරන අනෙකුත් දෙපාර්තමේන්තුවලින් ආදායම් ඇස්තමේන්තු සඳහා තොරතුරු කැඳවා නොතිබීම. | 2.6(ඇ)(ii) (ඊ) (i)<br>2.6(ඒ)(ii),(iii),(iv)<br>2.6(එ)(i)<br>(ඌ) (ii) (iii) |
| 128(2)(ඉ) | රාජ්‍ය ආදායම් එකතු කිරීම සම්බන්ධව කටයුතු කරන ගණන්දීමේ නිලධාරීන් සහ දෙපාර්තමේන්තු විමසා, රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යොදන බව. | 1. ආදායම් සංකේතයට අදාළව ආදායම් රැස්කරන ආයතනවලින් හිඟහිටි ආදායම් පිළිබඳ තොරතුරු කැඳවා අඩුපාඩු. | 2.6 (අ) (ii) (iii),(ඇ)(iii), (ඈ),(ඉ) |
| | | 2. හිඟ ආදායම් එකතු කර ගැනීමට අපොහොසත් වීම. | 2.6 (ඔ) |
| 128(2)(ඊ) | විවිධ දෙපාර්තමේන්තු මගින් ආදායම් එකතු කර ගැනීම සම්බන්ධව කෙරෙන කාර්යයන් ඒ ඒ ගණන්දීමේ නිලධාරීන් ද විමසා සමායෝජනය කරන බව | ආදායම් සංකේතයට අදාළව ආදායම් රැස්කරන වෙනත් ආයතන සමග සාකච්ඡා හෝ ලිපි හුවමාරු කිරීම් සිදු කර නොතිබුණි. | 2.6 (ඌ) (iv) |
| 128(2)(උ) | රාජ්‍ය ආදායම් එකතු කර ගැනීමට කටයුතු කරන විවිධ දෙපාර්තමේන්තු වලින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ද, උචිත ආදායම් සංකේතය යටතේ එකතු කරනු ලබන මුදල් පිළිබඳ වාර්තා තබා ගන්නා බවටද, ඒ ඒ ආදායම් සංකේතය යටතේ එකතු | භාණ්ඩාගාර අවසන් පරිගණක මුද්‍රිත පිටපත්වල සංඛ්‍යා පදනම් කරගෙන ආදායම් ගිණුම පිළියෙල කිරීම. | 2.6(ඊ) (iii),(iv) |

| | | | |
|---|---|---|---|
| | කරන ලද ආදායම පිළිබඳ භාණ්ඩාගාරය තබා ගෙන ඇති ගිණුම් සමග එකී වාර්තා සටහන් සැසදෙන බව. | | |
| 128(2)(එ) | අවශ්‍යතැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගෙන් වෙනස්වීම් ගැන සැලකිලිමත්ව, කලින් කල වරිපනම් හා අයකිරීම් හෝ බදු සහ ගාස්තු ආදිය අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට නිසි පියවර ගන්නා බව. | ආදායම් විචලනය සම්බන්ධයෙන් බලපෑ කරුණු පිළිබඳ විශ්ලේෂණය නොකිරීම | 2.6(අ)(ii)<br>2.6(ඔ)(iii), (iv), (v) |

## 2. ප්‍රමාණවත් හා වැදගත් විගණන නිරීක්ෂණ
--------------------------------------------

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය
----------------------------------------

(අ) භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය.
(ආ) ගෙවීම් පද්ධතිය හරහා භාණ්ඩාගාර අරමුදල් උපයෝජනය කිරීම.
(ඇ) වියදම් ආයතනවල අරමුදල් අවශ්‍යතා තක්සේරු කර ප්‍රමුඛතා මත අරමුදල් නිදහස් කිරීම.
(ඈ) භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම.
(ඉ) රජයේ උපණය අයකිරීම සහ ඊට අදාල භාණ්ඩාගාර පොත්පත් පවත්වාගෙන යාම.
(ඊ) දෙපාර්තමේන්තුව වෙත පවරා ඇති බදු නොවන ආදායම් ශීර්ෂ 12 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා ගිණුම්ගත කිරීම.
(උ) විදේශ ආධාර ණය සහ ප්‍රදාන යටතේ ලැබෙන මුදල් අදාල ව්‍යාපෘති වෙත නිකුත් කිරීම සඳහා පහසුකම් සැලසීම.
(ඌ) විදේශ ආධාර ගිණුම් තැබීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීම.
(එ) රාජ්‍ය ණය ගැනීම් හා ණය සේවා ගිණුම්ගත කිරීම.
(ඒ) රජයේ බැංකු ගිණුම් සහ අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම/ පවත්වාගෙන යාම සඳහා බලයදීම හා අධීක්ෂණය කිරීම.
(ඔ) රාජ්‍ය නිලධාරීන්ගේ දේපල ණය ඇප යෝජනා ක්‍රමය මෙහෙයවීම.

### 2.2 කාර්යසාධනය
---------------

**(අ) භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය**
--------------------------------------------

සමාලෝචිත වර්ෂය තුළ ආදායම් හා අනෙකුත් මුදල් ලැබීම් සහිතව මුළු මුදල් ලැබීම් රු. බිලියන 1,765.3 ක් වී තිබුණු අතර ඉන් පුනරාවර්තන වියදම් රු. බිලියන 1,853.6 ක් හා ප්‍රාග්ධන වියදම් රු. බිලියන 646.1 ක් ලෙස එකතුව රු. බිලියන 2 ,499.7 ක් දැරීමෙන් පසු වර්ෂය තුළ ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 734.4 ක් වී තිබුණි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව රු. බිලියන 182.2 කින් හෙවත් සියයට 32.99 කින් ඉහළ අගයක් ගෙන තිබුණි. එම ශුද්ධ මුදල් හිඟයට වර්ෂය තුළ ලබාගත් ශුද්ධ ණය ගැනීම් රු. බිලියන 695.6 ක්, ගැලපීම් ගිණුමේ ශේෂය රු. බිලියන 12.9 ක් හා වර්ෂ ආරම්භක මුදල් හිඟය රු. බිලියන 160.3 ක් ගැලපීමෙන් පසු 2017 දෙසැම්බර් 31 දිනට මුදල්

ශේෂය (හිඟය) රු. බිලියන 186.2 ක් වී තිබුණු අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මුදල් හිඟය රු. බිලියන 25.9 කින් හෙවත් සියයට 16.15 කින් වැඩි වී තිබුණි.

**(ආ) අග්‍රිම නිදහස් කිරීම**

--------------------

සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීමට අවශ්‍ය අග්‍රිම පහත දැක්වෙන ආකාරයට මහා භාණ්ඩාගාරය විසින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, කොමිෂන් සභා හා අනෙකුත් ආයතන වෙත නිදහස් කර තිබුණි.

| | පුනරාවර්තන | මූලධන | එකතුව |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ඇස්තමේන්තුගත වියදම | 2,026,683 | 935,259 | 2,961,942 |
| සමාලෝචිත වර්ෂය තුළ ඉල්ලුම් කළ අග්‍රිම වටිනාකම | 1,334,466 | 863,557 | 2,198,023 |
| වාර්ෂික අග්‍රිම සීමාව | 1,201,380 | 584,114 | 1,785,494 |
| වර්ෂය තුළ නිදහස් කළ අග්‍රිම වටිනාකම | 1,131,340 | 400,819 | 1,532,159 |
| වාර්ෂික අග්‍රිම සීමාවට වඩා අඩුවෙන් අග්‍රිම නිදහස් කිරීම | 70,040 | 183,295 | 253,335 |

ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික අග්‍රිම සීමාවට වඩා පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 70,040 ක් හා මූලධන වියදම් සඳහා රු. මිලියන 183,295 ක් ලෙස එකතුව රු.මිලියන 253,335 ක් අඩුවෙන් මහා භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිදහස් කර තිබුණි. එමෙන්ම වාර්ෂික ඇස්තමේන්තුගත පුනරාවර්තන හා මූලධන වියදම්වලින් වර්ෂය තුළ නිදහස් කළ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 56 ක් හා සියයට 43 ක් පමණක් විය.

## 2.3 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

---------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගැනීම සඳහා රු. මිලියන 7.28 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 2.63 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

-------------------------

සමාලෝචිත වර්ෂයේදි පවරා ගෙන තිබුණු රු. මිලියන 6.5 ක් වටිනා වාහනයක් 2017 විසර්ජන ගිණුමේ සටහන (i) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

## 2.5 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

----------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදන, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 492,488.77 | 470,532.19 | 21,956.58 | 04 |
| | මූලධන | 1,066.80 | 649.13 | 417.67 | 39 |
| | රාජ්‍ය ණය ආපසු ගෙවීම් | 747,000.00 | 702,518.90 | 44,481.10 | 06 |
| | **මුළු එකතුව** | **1,240,555.57** | **1,173,700.22** | **66,855.35** | **05** |
| 2014 | පුනරාවර්තන | 455,503.70 | 453,774.80 | 1,728.91 | 0 |
| | මූලධන | 3,155.89 | 1,961.08 | 1,194.81 | 38 |
| | රාජ්‍ය ණය ආපසු ගෙවීම් | 658,719.22 | 635,966.57 | 22,752.65 | 03 |
| | **මුළු එකතුව** | **1,117,378.81** | **1,091,702.45** | **25,676.37** | **02** |
| 2015 | පුනරාවර්තන | 531,602.58 | 528,958.83 | 2,643.74 | 0 |
| | මූලධන | 5,475.32 | 5,457.99 | 17.33 | 0 |
| | රාජ්‍ය ණය ආපසු ගෙවීම් | 863,781.10 | 846,395.11 | 17,385.99 | 02 |
| | **මුළු එකතුව** | **1,400,859.00** | **1,380,811.93** | **20,047.06** | **01** |
| 2016 | පුනරාවර්තන | 621,424.36 | 614,495.63 | 6,928.73 | 01 |
| | මූලධන | 7,626.21 | 5,759.69 | 1,866.52 | 24 |
| | රාජ්‍ය ණය ආපසු ගෙවීම් | 743,380.69 | 741,548.63 | 1,832.06 | 0 |
| | **මුළු එකතුව** | **1,372,431.26** | **1,361,803.95** | **10,627.31** | **01** |
| 2017 | පුනරාවර්තන | 767,407.13 | 741,783.85 | 25,623.28 | 03 |
| | මූලධන | 2,249.78 | 2,142.74 | 107.04 | 05 |
| | රාජ්‍ය ණය ආපසු ගෙවීම් | 898,105.65 | 867,483.51 | 30,622.14 | 03 |
| | **මුළු එකතුව** | **1,667,762.56** | **1,611,410.10** | **56,352.46** | **03** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 0.1 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 11 ක් සඳහා එකතුව රු. මිලියන 464.7 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු. මිලියන 204.9 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 92 ක් දක්වා පරාසයක පැවතුණි.

## 2.6 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 12 ක් සඳහා එකතුව රු. මිලියන 60,075 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර, පසුව එම ඇස්තමේන්තු රු. මිලියන 51,039 ක් දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 55,099.23 ක ආදායම් රැස්කර තිබුණි. එය මූලික ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 92 ක් හා සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 108 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | මූලික ඇස්තමේන්තුගත ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට | | ඉක්මවීම / (ඌනතාවය) | | ඉක්මවීම/ (ඌනතාවය) | |
|---|---|---|---|---|---|---|---|
| | | සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව | මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව | සංශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස | මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | | |
| 20.02.01.99 | 400 | 278 | 358.75 | 80.75 | (41.25) | 29 | (10) |
| 20.02.02.01 | 4,950 | 4,300 | 4,648.59 | 348.59 | (301.41) | 08 | (06) |
| 20.02.02.99 | 1,300 | 1,650 | 2,746.79 | 1,096.79 | 1,446.79 | 66 | 111 |
| 20.03.01.00 | 125 | 110 | 120.68 | 10.68 | (4.32) | 10 | (03) |
| 20.03.02.99 | 6,000 | 5,000 | 6,143.40 | 1,143.40 | 143.4 | 23 | 02 |
| 20.03.03.02 | 8,500 | 2,600 | 1,506.98 | (1,093.02) | (6,993.02) | (42) | (82) |
| 20.03.05.00 | 1,000 | 1 | 7.25 | 6.25 | (992.75) | 625 | (99) |
| 20.03.99.00 | 11,000 | 11,000 | 12,894.83 | 1,894.83 | 1,894.83 | 17 | 17 |
| 20.05.99.00 | 2,500 | 1,750 | 2,078.73 | 328.73 | (421.27) | 19 | (17) |
| 20.06.02.00 | 300 | 100 | 144.08 | 44.08 | (155.92) | 44 | (52) |
| 20.06.04.00 | 14,000 | 16,250 | 16,418.06 | 168.06 | 2,418.06 | 1 | 17 |
| 30.01.01.00 | 10,000 | 8,000 | 8,031.09 | 31.09 | (1,968.91) | 0.4 | 0.04 |
| | **60,075** | **51,039** | **55,099.23** | **4,060.23** | **(4,975.77)** | **8** | **8** |

=====     =====     =======   ======     ========

ඉහත ආදායම් ගිණුම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) 20.02.01.99 දරන ආදායම් සංකේතය - අනෙකුත් කල්බදු කුලී**
**-----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ආදායම් ගිණුමෙහි බදු කුලී වැනි ගිවිසුම් මගින් රැස්කරන ආදායම් ගිණුම් ගත කර නොතිබුණි. එබැවින් එම ආදායම නිවැරදිව පුරෝකථනය කිරීමට හැකියාව තිබුණද, සිදුකරන ලද පුරෝකථනයන් පසුව විශාල ලෙස විචලනයට ලක්වී තිබුණි.

(ii) වැය ශීර්ෂ 11 කින් ආදායම් ලැබීම් හා ආපසු ගෙවීම් මෙම ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අයත් බත්තරමුල්ලේ පිහිටි සුහුරුපාය ගොඩනැගිල්ලෙන් පමණක් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 272.67 ක ආදායමක් ලැබී තිබුණි. එය මෙම ආදායම් සංකේතය යටතේ වූ මුළු ශුද්ධ ආදායමෙන් සියයට 76 ක ප්‍රමාණයක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ආදායම් තීරණය කිරීම, රැස් කිරීම හා ගිණුම්ගත කිරීම පිළිබඳව සැලකිය යුතු මට්ටමේ අධීක්ෂණයක් හෝ පසුවිපරම් කිරීමක් ආදායම් ගණන්දීමේ නිලධාරියා හෝ ආදායම් රැස් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් සිදු කර තිබුණු බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම ආයතන සඳහා වෙන් කර තිබුණු වර්ග අඩි ප්‍රමාණයන් හා වර්ග අඩියක වටිනාකම රු. 44 ක සිට රු. 215 ක් දක්වා පරාසයකින් සමන්විත වී තිබුණි. ඒ හේතුවෙන් වරින් වර අදාළ වටිනාකම් සංශෝධනය වී තිබීම, වර්ග අඩි ප්‍රමාණ හා වර්ග අඩියක වටිනාකම තීරණය කිරීමේදී තක්සේරු දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් ලබාගෙන නොතිබුණි. 2018 ජුනි 13 දින වන විටත් ඊට අදාළව ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

- එක් එක් මාසය තුළදී ආදායමට බැරවී තිබූ වටිනාකම්වලට අදාළ විස්තරාත්මක උපලේඛන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් හෝ ආරක්ෂක අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. 2018 ජනවාරි 01 දින සිට 2018 ජුනි 13 දින දක්වා 2017 වර්ෂයට අදාළව කුලී ආදායම ලෙස රු. මිලියන 49.91 ක් ලැබී තිබුණද, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් 2017 දෙසැම්බර් මාසයට අදාළව ලැබිය යුතු රු.මිලියන 5.02 ක කුලිය අයවී නොතිබුණි. තවද, ආදායම් ගිණුමේ හිඟ ආදායම් යටතේ සුහුරුපාය ගොඩනැගිල්ලට අදාළව කිසිදු හිඟ ආදායමක් හඳුනාගෙන නොතිබුණි.

(iii) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් මෙම ආදායම් සංකේතය යටතේ රු. මිලියන 51.70 ක ආදායම් රැස්කර තිබුණි.බදුකුලී ගිවිසුම් 03ක් යටතේ එකතු කර තිබුණු ආදායම් එම රැස්කර තිබුණු ආදායමෙන් සියයට 14 ක ප්‍රතිශතයක් වී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඇමරිකා එක්සත් ජනපද රජය හා ශ්‍රී ලංකා රජය අතර 1991 දෙසැම්බර් 01 දින සිට වර්ෂ 20 ක කාලපරිච්ඡේදයක් සඳහා ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථානයක් ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීමට ඉඩමක් ලබාදීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුම

2016 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර තිබුණි. 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ එකතුව රු.මිලියන 14.41 ක කුලී ආදායම් ලැබී තිබුණි. නමුත් 2016 වර්ෂයෙන් පසු 2018 සැප්තැම්බර් 30 දින වන විටත් එම ගොඩනැගිල්ල නැවත කුලියට ලබාදී නොතිබීම නිසා රජයට ලබාගත හැකිව තිබුණු ආදායමක් අහිමිවී තිබුණි.

- කොළඹ 11, මහ වීදියේ, අංක 223 හා 227 දරන පරිශ්‍ර කුලී පදනම මත ලබාදීම සම්බන්ධයෙන් පුද්ගලික සමාගම් දෙකක් සමඟ 2003 ජූනි 01 දින ගිවිසුම්වලට එළඹ තිබුණි. අවස්ථා දෙකකදී එම ගිවිසුම් දීර්ඝ කිරීම් සිදු කර තිබුණද, 2011 ජූනි 01 දින සිට 2019 අප්‍රේල් 30 දින වන විටත් සංශෝධනයකින් තොරව හා ලිපි මගින් පමණක් ගිවිසුම දීර්ඝ කරමින් පැවතුණි. ඒ හේතුවෙන් අවසාන කාලපරිච්ඡේද තුළ මාසික කුලිය අඩු වී තිබූ බැවින් හා විධිමත් පරිදි ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා රජයට ලැබිය යුතුව තිබුණු ආදායම අඩු වී තිබුණි.

- ශ්‍රී ලංකා රජය සහ චයිනා බේ ඔයිල් ෆාම් (China Bay Oil Farm) ආයතනය සමඟ 2003 පෙබරවාරි 07 දින සිට වර්ෂ 35 ක් දක්වා කාලපරිච්ඡේදයක් සඳහා ගිවිසුමකට එළඹ තිබුණි. එම ගිවිසුමේ වර්ෂ 05 කට වරක්, ඇමරිකා එක්සත් ජනපදයේ පූර්ව අවුරුදු 05 ක සමුච්චිත උද්ධමන අනුපාතය පදනම් කරගෙන (based on the cumulative rate of inflation of the United States for the proceeding (05) years) ස්වයංක්‍රීයව සංශෝධනය වියයුතු බව හා නිෂ්පාදන ධාරිතාව අනුව කුලිය ගැලපිය යුතු බව සඳහන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.
    - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක PE/EN/CPC/Gen/2017 දරන ලිපිය අනුව, අවබෝධතා ගිවිසුමේ 1.2 වගන්තියට අනුව ගබඩා පහසුකම් හා ඉඩමේ භුක්තිය සඳහා මාස 06 ක් ඇතුළත බදුකුලී ගිවිසුමකට එළඹිය යුතුව තිබුණි.එම බදුකුලී ගිවිසුම ක්‍රියාත්මක වූයේ නම් අදාළ බදුකුලී ගෙවීම් මෙම අවබෝධතා ගිවිසුම අනුව යාවත්කාලීන වියයුතු විය. එහෙත් 2019 ජූලි 30 දින දක්වා අදාළ බදුකුලී ගිවිසුමට එළඹීම සඳහා පැවති රජයන් විසින් ප්‍රතිපත්තිමය වශයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන තිබුණු බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැවින් අදාළ කුලී ගැලපීම අවබෝධතා ගිවිසුමේ සඳහන් ආකාරයෙන් සිදුකිරීමට නොහැකි වී ඇති බව දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි.

    - මේ සම්බන්ධයෙන් විගණනය සිදුකළ විමසීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2018 ජූනි 25 දිනැති අංක PED/ACC/in-Audit 2018 (1) දරන ලිපියෙන් ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයට අදාල චයිනා බේ ඔයිල් ෆාම් ආයතනය සම්බන්ධ ගිවිසුම හා නියමිත ගෙවීම් පිළිබඳ තොරතුරු මේ වන විට ආයතන වෙතින් ලබාගෙන ඇති බවත් මේ සම්බන්ධයෙන් නීති කටයුතු දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමට අදහස් කර ඇති බවත්, උපදෙස් ලැබුණු පසු විස්තර විගණනය වෙත ඉදිරිපත් කළහැකි බවත් දන්වා ඇත.

    - සමාලෝචිත වර්ෂයේදී ඇමරිකානු ඩොලර් 100,000 ක ආදායමක් ලැබිය හැකිව තිබූ මෙම ගිවිසුම යාවත්කාලීන නොවීම හා එහි ඇතුළත් කොන්දේසි ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රජයට හිමිවිය යුතු ආදායම් අහිමිව තිබූ බව මේ අනුව නිරීක්ෂණය විය.

**(ආ) 20.02.02.01 දරන ආදායම් සංකේතය - පොළිය - ණයදීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ආදායම් සංකේතයට අදාළව ආදායම් ගණන්දීමේ නිලධාරී විසින් 2016 ජුලි 29 දින රු. මිලියන 3,574 ක මූලික ඇස්තමේන්තුවක්ද, 2017 ජුලි 28 දින රු. මිලියන 4,340 ක සංශෝධිත ඇස්තමේන්තුවක්ද ඉදිරිපත් කර තිබුණු අතර, නැවත එය රු.මිලියන 4,300 ක් ලෙස සංශෝධනය කර තිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ උපණය ශේෂය රු. මිලියන 178,281 ක් විය. ඊට අදාළ පොලී අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම නිසා හිඟ ආදායම් වාර්තාවලට අනුව ආයතන 07 ක් වෙත පමණක් ලබා දී තිබූ ණය සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විට අයකර ගතයුතු හිඟ පොලී එකතුව රු. මිලියන 1,817 ක් වී තිබුණි. ණය පොළී අයකරගැනීම සම්බන්ධව උපදෙස් ලබාදෙන ලෙස නීති කටයුතු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර තිබුණද, මිල්කෝ ආයතනයෙන් අයකර ගෙන තිබූ රු. මිලියන 5 ක් හැර වෙනත් කිසිදු මුදලක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**(ඇ) 20.02.02.99 දරන ආදායම් සංකේතය - පොළිය - වෙනත්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 වර්ෂයේ රු. මිලියන 1,300 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 1,650 ක් ලෙස සංශෝධනය කර තිබුණු අතර, වර්ෂය තුළ රැස්කර තිබුණු මුළු ශුද්ධ ආදායම රු. මිලියන 2,747 ක් වූයෙන්, එය මූලික ඇස්තමේන්තුවෙන් සියයට 211 ක් සහ සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 166 ක් විය. වර්ෂය ආරම්භයේදී ඇස්තමේන්තු නොකරන ලද භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ඩොලර් ගිණුම් 02 කට අදාළ 2016 හා 2017 වර්ෂවලට අදාළ පොළී ආදායමක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් ලැබීම හේතුවෙන් මෙසේ විචලනයක් ඇතිවී තිබුණු බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි. 2017 ජුලි 28 දින ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් රු. මිලියන 1,000 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණද, එය රු. මිලියන 1,650 ක් ලෙස සංශෝධනය කර තිබුණි.

(ii) මෙම ආදායම් සංකේතය යටතේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වනුයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම යටතේ ලබා දෙන ණය සඳහා අයකරනු ලබන පොළිය වේ. කෙසේ වුවද, මෙම ණය ශේෂ අයකර ගැනීමට විකල්ප නොමැති යැයි තීරණය කරන ලද අවස්ථාවලදී මුදල් රෙගුලාසි 113 යටතේ එම ශේෂ අත්හැරීමට කටයුතු කරනු ලබන අතර 2015, 2016 හා 2017 වර්ෂවල එසේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අත්හැරීම සඳහා කටයුතු කර තිබූ ණය ශේෂය රු. මිලියන 2.68 ක් වී තිබුණි. මේ අනුව, මෙම අත්හැර දැමීම් වැඩිවීමේ ප්‍රවණතාවයක් විගණනයේදී නිරීක්ෂණය වන අතර 2016 වර්ෂයේදී එය කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරුණි. 2017 වර්ෂයේදී ද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ආයතන 5 කට අදාල රු. මිලියන 0.66 ක රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්වල ණය ශේෂ කපාහැර තිබුණි.

(iii) නියැදි පදනම මත තෝරාගත් රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 27 ක් පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි, ස්ථාන මාරුවී ගිය, සේවය අතහැරගිය, වැඩ තහනම් කළ, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. මිලියන 253.73 ක ණය ශේෂ විගණිත දින වන විටත් අයකරගත නොහැකිවී තිබුණි. 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හිඟ ආදායම් අයකර

ගැනීමට කටයුතු කිරීම හා අයවීමට ඇති හිඟ ආදායම් තවදුරටත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවර ගතයුතු වුවද, මෙම ණය ශේෂවලට අදාළ පොළිය අයකර ගැනීම සම්බන්ධයෙන් සුදුසු පියවරක් ගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

**(ඇ) 20.03.01.00 දරන ආදායම් සංකේතය -විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්**

---

ආයතන දෙකක් විසින් මෙම ආදායම් ශීර්ෂයට මුළු ආදායමින් පිළිවෙලින් සියයට 39 ක් හා සියයට 35 ක් වශයෙන් වූ ආදායම් රැස්කර තිබුණි. අදාල ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් එම ආදායම් පරිපාලනයට අදාලව කිසිදු තොරතුරක් පවත්වා නොතිබුණි. 2016 දෙසැම්බර් 20 දිනැති අංක 01/2015 (v) දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය මගින්, එම වගකීම ආදායම් රැස්කරනු ලබන ආයතන ප්‍රධානීන් වෙත පවරා තිබුණු බව විගණනයට දන්වා තිබුණි. එසේ වුවද, එම වගකීම ආදායම් රැස්කරනු ලබන ආයතන ප්‍රධානීන් විසින්ද විධිමත්ව සිදුකර නොතිබූ බව විගණන පරීක්ෂණවලදී අනාවරණය වීය. මෙවැනි ආදායම් ප්‍රශස්ථ ලෙස රැස් කර රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට අදාළව ආදායම් ගණන්දීමේ නිලධාරීගේ අධීක්ෂණය, නියාමනය ඇතුළු කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ.

**(ඉ) 20.03.02.99 දරන ආදායම් සංකේතය - විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ**

---

2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව අයවීමට ඇති හිඟ මුදල් තවදුරටත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවර ගතයුතු වුවද, ගිණුමේ 2014 හා 2015 වර්ෂවලට අදාළව එකතුව රු. මිලියන 0.96 ක් වූ හිඟ මුදල් හා පසුගිය වර්ෂයේ හිඟ මුදල වූ රු. මිලියන 0.04 ක් අය කරගෙන රාජ්‍ය ආදායමට බැර කිරීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.

**(ඊ) 20.03.03.02 දරන ආදායම් සංකේතය -විකුණුම් සහ ගාස්තු - දඩමුදල් හා රාජසන්තක කිරීම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රැස්කළ මුළු ශුද්ධ ආදායම වූ රු. මිලියන 1,507 කින් රු. මිලියන 1,072 ක් හෙවත් සියයට 71 ක් අධිකරණ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණි. කෙසේවුවද, මෙම ගිණුමට අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු කළද, මෙම ආදායම් එකතු කිරීම ගිණුම් ඒකක 225 කට වැඩි ප්‍රමාණයක් විසින් සිදු කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනැති අංක 01/2015(V) දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාර, ආදායම් ගණන්දීමේ නිලධාරී විසින් මෙම සියළුම ආදායම් සම්බන්ධයෙන් සෘජුවම අධීක්ෂණය කිරීම හා ගිණුම් පොත්පත් පවත්වා ගැනීම සිදුකළ යුතුව තිබුණි. නමුත් එය ප්‍රායෝගික නොවන බැවින් 2015 ජුලි 20 දිනැති අංක 01/2015 චක්‍රලේඛයේ 4 ඡේදයේ (අ) – (ඇ) ඡේද අනුව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් සිදු කළයුතු බව දැනුම්දී තිබුණි. ඒ අනුව මෙම ආදායමෙන් සියයට 71 ක ප්‍රමාණයකට අදාළ ලිපිලේඛන හෝ ආදායම් පරිපාලනයට අදාල තොරතුරු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ශීර්ෂය යටතේ මුළු ශුද්ධ ආදායමෙන් සියයට 27 ක් එනම් රු. මිලියන 411.80 ක ආදායම් ලැබී තිබුණු අතර එම ආදායම් රාජසන්තක කිරීම්වලට අදාළ විය.

(iii) ජාතික ලොතරැයි මණ්ඩලයේ 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අහිමි කරන ලද ත්‍යාග (Forfeited prizes) වටිනාකම රු. මිලියන 339.07 ක් වූ අතර රාජ්‍ය ආදායම් මුදල් පදනම

මත ගිණුම්ගත කිරීම නිසා 2016 ඔක්තෝබර් 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලසීමාවට අදාලව අහිමි කරන ලද ත්‍යාග මුදල වූ රු.මිලියන 82.49 ක් ද, ඒ තුළ ඇතුළත් වී තිබුණි.

(iv) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, ආදායමින් ආපසු ගෙවීම් රු. මිලියන 1,253.77 ක් වී තිබුණු අතර එම වටිනාකම මුළු ආදායම වූ රු. මිලියන 1,506.98 න් සියයට 83 ක් වී තිබුණි. වැරදි නිවැරදි කිරීම, එම ආපසු ගෙවීම්වලින් සියයට 99 ක් වී තිබුණි. එසේ වුවද, මෙම වැරදිම් අවම කරගැනීම සම්බන්ධයෙන් ආදායම් ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමක් හෝ ඊට අදාලව ඉදිරි පියවර ගැනීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## (උ) 20.03.05.00 දරන ආදායම් සංකේතය -භාණ්ඩාගාර බැඳුම්කර අධිභාර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති පරිදි, රාජ්‍ය ආදායම් මුදල් පදනම මත හඳුනා ගත්තද, භාණ්ඩාගාර බැඳුම්කර අධිභාර ආදායම අදාළ කාලපරිච්ඡේදය තුළ විලම්භනය කිරීම නිසා මෙම ආදායම සම්බන්ධයෙන් එසේ මුදල් පදනම මත කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 1,000 ක් වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1 ක් ලෙස සංශෝධනය කර තිබුණද, ආදායම් ගිණුමේ එය රු. මිලියන 0.5 ක් ලෙස සදොස් ලෙස දක්වා තිබුණි.

(iii) රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම රු. මිලියන 7.25 ක් වීම හේතුවෙන් මූලික ආදායම ඇස්තමේන්තුවෙන් එය සියයට 0.7 ක් හා නිවැරදි සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 725 ක් වී තිබුණි. 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 0.3 ඡේදය ප්‍රකාරව, නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා රජයේ වියදම තීරණය කිරීමට ආදායම නිවැරදිව පුරෝකථනය කිරීම ඉතා වැදගත් වුවද, විශාල විචලනයන් පැවතීම තුළින් එම අරමුණ ඉටුවී නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## (ඌ) 20.03.99.00 දරන ආදායම් සංකේතය - විකුණුම් හා ගාස්තු (අනෙකුත් ලැබීම්)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ආදායම් ගිණුමට අදාලව රු. මිලියන 13,511.78 ක් ආදායම් වශයෙන් ලැබී තිබූ අතර රු. මිලියන 111.80 ක් ආපසු ගෙවීම් වශයෙන්ද, රු. මිලියන 505.15 ක මුදලක් වැරදි නිවැරදි කිරීමට අදාළ හර කිරීම් වශයෙන්ද, හඳුනාගෙන තිබූ අතර ඒ අනුව එකතුව වූ රු. මිලියන 616.95 ක මුදලක් ආදායමෙන් ආපසු ගෙවීම් කර තිබීම නිසා මුළු ශුද්ධ ආදායම රු. මිලියන 12,894.83 ක් වී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 128(2) (ඇ) ප්‍රකාරව, ආදායම් ගළන්දීමේ නිලධාරී විසින් ආදායම් එකතු කර ගැනීම සම්බන්ධයෙන් තමා වගකීමට බැඳී ඇති රාජ්‍ය ආදායමින් යම් කිසි කොටස් වෙනත් දෙපාර්තමේන්තු හා කාර්යාල මගින් එකතු කරනු ලැබේ නම්, එම

දෙපාර්තමේන්තුවලින් හා කාර්යාලවලින් වාර්තා ලබා ගෙන ඒවායේ සඳහන් කරුණු රාජ්‍ය ආදායම් ඇස්තමේන්තුවලටද අන්තර්ගත කරන බවට සහතික වන සේ ප්‍රමාණවත් විධිවිධාන යෙදිය යුතුව තිබුණි. නමුත් 2016 දෙසැම්බර් 30 දිනැති අංක 01/2015 (v) දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය මගින් එම වගකීම දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් විසින් සිදු කළ යුතු බව සඳහන් කර තිබුණි.

මේ නිසා ආදායම් ගිණුම විගණනයේදී අවශ්‍ය ලිපි ලේඛන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සතුව නොතිබීම හේතුවෙන් එම ආදායම් ගිණුම්වලට අදාළව ආදායම් රැස් කිරීම් කර තිබූ ආයතන දෙකක් නියැදි පදනම මත තෝරා ගෙන 2018 ජූනි මාසයේදී සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් තම වගකීම ආදායම් රැස්කරන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු සහ ආයතන ප්‍රධානීන් වෙත පවරා තිබුණද, ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පොදු චක්‍රලේඛය හැර වෙනත් කිසිදු ලිඛිත උපදේශයක් ලබාදී නොතිබුණි.

- එම ආදායම් රැස් කරනු ලබන ආදායම් ඒකක වෙතද එසේ ලිඛිත උපදෙස් නිකුත් කර නොතිබුණි.

- 2015 ජූලි 20 දිනැති අංක 01/2015 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරි හා ආදායම් රැස් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ආදායම් සම්බන්ධයෙන් තම වගකීම් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබූ අවස්ථා විගණනයේදී අනාවරණය විය.

(iii) පහත සඳහන් එක් එක් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කිරීමේ කටයුතු සම්බන්ධයෙන් සිදුකළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ අපනයන කෘෂිකාර්මික භෝග වගා වැඩසටහන යටතේ බෝග පැල නිකුත් කර තිබුණු අතර එම පැලවලට අදාළ ප්‍රකාශිත මිලෙන් සියයට 50 ක් වගාකරුවන් විසින් දැරිය යුතු විය. ඒ සඳහා නව ආදායම් සංකේතයක් 2018 ජූනි මාසය වන විටත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් ලැබී නොතිබුණි. තවද, අදාල ආදායම් රැස්කිරීම හා ගිණුම්ගත කිරීම නිවැරදිව සිදුවේද යන්න පිළිබඳව සැලකිය යුතු මට්ටමේ අධීක්ෂණයක් හෝ පසුවිපරමක් ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් හෝ ආදායම් රැස්කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. මෙම විගණන නිරීක්ෂණය සෘජුවම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අදාළ නොවන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසා තිබුණද මහා භාණ්ඩාගාර අධීක්ෂණය පැවරී ඇති දෙපාර්තමේන්තුව ලෙස එම දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීමට අදාළව තවදුරටත් මැදිහත්වීම අවශ්‍ය බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

  - මුදල් තැන්පත් කර තිබුණද, වාර්ෂිකව අංක 289-2-1-2202 දරන වැය විෂය යටතේ සලසා තිබුණු ප්‍රතිපාදන මත පමණක් මෙම පැල ලබාදීම් සිදු කර තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට ලැබී තිබුණු රු. මිලියන 3.04 ක් අදාළ ආදායම් ගිණුමේ සටහන් කර නොතිබුණි.

- දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී මෙම ආදායම් බැර කිරීම සඳහා ආරම්භ කර තිබූ නව බැංකු ගිණුමේ අවසන්වරට පිළියෙල කර තිබුණු 2018 මාර්තු මාසය සඳහා වන මූලා ප්‍රකාශය අනුව ද ඉහත කී පරිදි ගිණුම්ගත නොවූ හඳුනා නොගත් ලැබීම් ලෙස රු. මිලියන 2.25 ක් පැවතුණි.

- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඒකක 40 කින් ආදායම් එකතු කරමින් පැවති අතර, මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව, තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් තුළ හිමිකම් නොපෑම මත ඉකුත්වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් පවත්වා තිබුණු තැන්පතු ගිණුම් 04 ක පැවති රු. මිලියන 4 ක ශේෂ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. එසේම සත්ව ආහාර පනත යටතේ කෙරෙන බලපත්‍ර ලබා දීම සඳහා අයවන ගාස්තු සංශෝධනය නොවීමේ කාල පරාසය වර්ෂ 4ක සිට වර්ෂ 11ක් දක්වා විහිදී තිබුණි.

(iv) විගණනයේදී අනාවරණය වූ පරිදි, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ඇඹිලිපිටිය නායකත්ව සංවර්ධන ජාතික මධ්‍යස්ථානයේ බාහිර පුහුණු වැඩසටහනක් සඳහා පහසුකම් සැපයීම මගින් ලද රු. මිලියන 1.2 ක ආදායම, ඉහත ආදායම් ගිණුමට බැර නොකර ඊට අදාළ වියදම් දැරීම සඳහා එම මුදල පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණද, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

**(ඵ) 20.05.99.00 දරන ආදායම් සංකේතය- වර්තන පැවරීම - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්**

**------------------------------------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය ආදායම් ගිණුම්ගත කිරීම මුදල් පදනම මත සිදු කිරීම නිසා 2017 වර්ෂයේ ලැබූ රු. මිලියන 19.62 ක ශුද්ධ ආදයමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. මෙහිදී 2016 දෙසැම්බර් ආදායම, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙසත් 2017 දෙසැම්බර් ආදායම 2018 වර්ෂයේ ආදායමක් ලෙසත් ගිණුම්ගත වී තිබුණි.

(ii) 2016 වර්ෂයේ අලෙවි ආදායමක් නොතිබූ සෙවණ - පැසිවි හා සුපිරි ගොවිසෙත යන ලොතරැයි තුළින් 2017 වර්ෂයේදී රු. මිලියන 461.45 ක නව අලෙවි ආදායමක් උපයා තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ සමස්ත අලෙවි ආදායම රු. මිලියන 3,423.24 න් එනම් සියයට 20 කින් පහත වැටී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම විගණන නිරීක්ෂණය සෘජුව මහාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට අදාළ නොවන බව අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසා තිබුණද මහා භාණ්ඩාගාර අධීක්ෂණය පැවරී ඇති දෙපාර්තමේන්තුව ලෙස එම දෙපාර්තමේන්තු ආදායම් රැස්කිරීමට අදාළව තවදුරටත් මැදිහත්වීම වැදගත් බව නිරීක්ෂණය විය.

(iii) ආරෝග්‍ය ශාලා සඳහා අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම හා දිවයින පුරා වූ රෝහල්වල අළුත්වැඩියා කටයුතු සඳහා අරමුදල් රැස්කිරීමේ අරමුණින් සෞඛ්‍ය සංවර්ධන ලොතරැයියක් පවත්වනු ලැබීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. 1998 අංක 22 දරන මුදල් (සංශෝධිත) පනතේ 7(4) වගන්තිය ප්‍රකාරව, අමාත්‍යාංශ ලේකම් මගින් ලොතරැයි ආදායමින්, මණ්ඩලයේ අනුමත වියදම් අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු විය. ලොතරැයි මිල රු.10ක සිට රු.20ක් දක්වා ඉහළ නන්වන තෙක් හෝ අලෙවිය වර්ධනය වූ පසු හා වර්ෂයක් දක්වා පමණක් පවත්වා ගැනීමටත් යටත්ව 2007 වර්ෂය දක්වා අලෙවියෙන් සියයට 15 ක් වූ ලොතරැයියේ දායකත්වය 2008 වර්ෂයේ සිට සියයට 10 ක් දක්වා අඩුකර තිබුණි. එසේ වුවද, 2008 වර්ෂයේ සිට ලොතරැයි මිල රු.

10ක සිට රු. 20ක් දක්වා ඉහල නංවා තිබුණු අතර 2012 වර්ෂයට සාපේක්ෂව ලොතරැයි අලෙවි ආදායම ද වැඩි වී තිබුණද, ජාතික සම්පත ලොතරැයියේ සෞඛ්‍ය සංවර්ධන අරමුදලට වූ දායකත්වය සියයට 10 ක අගයක නොවෙනස්ව පැවතුණි. මේ නිසා 2012 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් මාසය දක්වා සෞඛ්‍ය සංවර්ධන අරමුදලට රු.මිලියන 180 ක් අහිමි වී තිබුණි.

(iv) ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන් සහ ඔවුන්ගේ යැපෙන්නන් වෙනුවෙන් රණවිරු සේවා අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන සුභසාධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීම වෙනුවෙන්, අධිකාරිය ආරම්භයේ සිට "ජයවිරු" ලොතරැයි ආදායමෙන් සියයට 30 ක දායකත්වයක් ලබාදී තිබුණි. 2011 මාර්තු මාසයේ සිට මෙම "ජයවිරු" නම වෙනස් කර ඒ වෙනුවට "සුපිරි වාසනා සම්පත" යොදා ගෙන තිබුණු අතර විගණනයට ඉදිරිපත් කළ ලිපිගොනුව අනුව, 2011 දෙසැම්බර් මාසයේ සිට එම දායකත්වය සියයට 10 ක් දක්වා අඩුකර තිබුණි. එහෙත් ඒ සම්බන්ධයෙන් ලබාගත් අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව, රණවිරු සේවා අධිකාරියට අහිමි වූ ආදායම 2011 දෙසැම්බර් මාසයේ සිට 2017 දෙසැම්බර් මාසය දක්වා රු.මිලියන 1,044 ක් වී තිබුණු අතර එම හිඟ දායකත්වය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් 2019 පෙබරවාරි 06 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(v) සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් සියයට 5 ක්, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික අරමුදලට දායකත්වය ලබාදී තිබුණි. 2010 අගෝස්තු 04 දින අමාත්‍ය මණ්ඩලය විසින් එම ප්‍රතිශතය සියයට 5 සිට සියයට 8.25 දක්වා වැඩි කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. නමුත් එම තීරණය 2019 පෙබරවාරි 06 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(vi) සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායමෙන් සියයට 10 ක ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදල හරහා ජාතික ක්‍රීඩා අරමුදලට බැර කරනු ලබන අතර 2013 ජූලි සිට එම දායකත්වය සියයට 5 ක් දක්වා අඩුකර තිබුණි.

(vii) 2017 වර්ෂයේදී ලොතරැයි 04 කින් ලද එකතුව රු. මිලියන 3,097 ක් වූ ආදායම්, ඒවා පිහිටුවීමේ අරමුණුවලට අදාළ අරමුදල්වලට යොදවා නොතිබුණි.

(viii) ලොතරැයි 05 ක 2017 වර්ෂයේදී මාස 06ක සිට මාස 11ක් දක්වා කාල සීමාවක් තුළ අලෙවි ආදායම් වාර්තා නොවීම නිසා එම ලොතරැයි මගින් අපේක්ෂිත අරමුණුවලට අදාළ අරමුදල් ලබා දීමේ දායකත්ව ප්‍රතිශතය අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ix) ජාතික ලොතරැයි මණ්ඩලය 1963 අංක 11 දරන මුදල් පනතින් ලොතරැයි පැවැත්වීම සඳහා සංස්ථාපිත ආයතනයක් වී තිබුණි. පනතේ විධිවිධාන ප්‍රකාරව ලොතරැයි පැවැත්වීම විවිධ අමාත්‍යාංශ වෙනුවෙන්ද සිදුකරනු ලබන අතර විවිධ අමාත්‍යාංශ වෙනුවෙන් පවත්වනු ලබන ලොතරැයි සඳහා දළ ආදායමෙන් දායකත්ව ප්‍රතිශතයක් මත මුදල් වෙන්කර අදාළ අමාත්‍යාංශ වෙත ඒකාබද්ධ අරමුදල හරහා ලබාදෙනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ප්‍රතිපාදන සලසා ගැනීමට යටත්ව එම මුදල් විවිධ අරමුදල්වල අරමුණු ඉටුකර ගැනීමට ලබාදෙන අතර එහි ප්‍රතිශතයන් අඩුකිරීම තුළින් එම අරමුදල්වලට/ආයතනවලට ලොතරැයියෙන් ලැබෙන දායකත්වය අඩුවීම මගින් අදාළ අරමුණු ඉටුකර ගැනීම ගැටළුකාරී වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**(ඒ) 20.06.02.00 දරන ආදායම් සංකේතය- ප්‍රාග්ධන වත්කම් විකිණීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ආදායම් ශීර්ෂයට අදාළව රු. මිලියන 190 ක දළ ආදායමක් ලැබී තිබූ අතර ඉන් රු. මිලියන 42.24 ක් එනම් සියයට 22 ක් වැරදි නිවැරදි කිරීමට අදාළ හර කිරීම් වී තිබුණි.

(ii) 1995 අගෝස්තු 03 දින තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශයට තීරුබදු රහිතව ආනයනය කර පවරා තිබූ ජීප් රථයක් 2016 අගෝස්තු 30 දින අපහරණය කර තිබුණි. වාහනය පැවරීමේදී ලියාපදිංචි සහතිකයේ වූ අඩුපාඩුවක් හේතුවෙන් මෙම වාහනය පැවරීම ප්‍රතික්ෂේප කර නියමිත බදු අයකර ගැනීම සඳහා රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි. මේ හේතුවෙන් වාහනය මිලදී ගත් පාර්ශවය වෙත වාහනය මිලදී ගැනීමට ගෙවන ලද රු. මිලියන 3.73 ක මුදල ආපසු ගෙවා තිබුණි. මේ අනුව ප්‍රාග්ධන වත්කම් විකිණීමේදී ඊට අදාළව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග දෝෂ සහිත බව විගණනයේදී නිරීක්ෂණය විය. මහා භාණ්ඩාගාර අධීක්ෂණය පැවරී ඇති දෙපාර්තමේන්තුව ලෙස එම ආදායම් රැස් කිරීමට අදාළව තවදුරටත් මැදිහත්වීම වැදගත් බව නිරීක්ෂණය විය.

(iii) 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව, රජයේ ආයතන සතු මෝටර් වාහන අපහරණය කිරීම සඳහා 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් උපදෙස් ලබාදී තිබුණි. එදින වන විටත් ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන 7723 ක් පැවතුණි. එම වාහන අපහරණ කටයුතු අවසන් කර එම මුදල් රාජ්‍ය ආදායමට බැර කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු ආදායම් ගණන්දීමේ නිලධාරියා විසින් සිදු කර නොතිබුණි.

(iv) රාජ්‍ය අංශය සතු සියළුම වත්කම් සඳහා දත්ත පදනමක් (Database) සකස්කර පවත්වාගෙන යාමට මෙන්ම රාජ්‍ය වත්කම් කළමනාකරණය සඳහා වූ තොරතුරු එක් රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා කොම්ප්ට්රොලර් ජනරාල් කාර්යාලයක් රේඛීය අමාත්‍යාංශය යටතේ පිහිටුවා තිබුණද, එම කාර්යාල මගින් හෝ වත්කම් විකිණීම හා ඊට අදාළ ආදායම් රැස්කිරීමේ විධිමත් ක්‍රමවේදයක් 2019 ජූලි 03 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**(ඔ) 20.06.04.00 දරන ආදායම් සංකේතය- ණය ආපසු අයකර ගැනීම**

---

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 181,367.52 ක් වූ මුළු උපණය ශේෂය තුළ ඇතුළත් එක් එක් ණය ශේෂයට අදාළ නියැදි පදනමක් මත තෝරා ගත් ලිපිගොනු කිහිපයක් පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව වෙත 1999 හා 2000 වර්ෂවල ලබා දී තිබූ පිළිවෙලින් රු.මිලියන 550.99 ක් හා රු. මිලියන 222.35 ක් වශයෙන් එකතුව රු.මිලියන 773.34 ක් වූ මුළු ණය ප්‍රමාණය අයකර ගැනීමට 2017 වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වී තිබුණි. මෙහි බැරකම් නිරවුල් කිරීම සම්බන්ධයෙන්, අදාළ ගෙවිය යුතු මුදල රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ලැබෙන මාසික බදු මුදලින් අයකර ගැනීමට කටයුතු කරන මෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සංස්ථාව වෙත දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

- සණස සංගමය වෙත අඩු ආදායම්ලාභීන් වෙත ලබාදීම සඳහා 1992 වර්ෂයේදී ලබා දී තිබූ රු. මිලියන 11.11 කින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන නොතිබුණි.

- ලංකා ධීවර සංස්ථාව වෙත අවස්ථා 03 කදී ලබා දුන් රු. මිලියන 116 ක් වූ ණය මුදල 2017 වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. මෙහිදී අවස්ථා 02 කදී ලබා දුන් ණය මුදල්වලින් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණු අතර ඉතිරි ණය මුදලින්ද 2010 වර්ෂයෙන් පසු අයකර ගැනීම් සිදු කර නොතිබුණි.

- 2017 ඔක්තෝබර් 03 දින භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදි හිඟ ණය මුදලින් කොටසක් ගෙවා මෙම ණය මුදල ක්‍රියාකාරී ගණයට ගෙන ඒමට කටයුතු කරන ලෙස ලංකා ධීවර සංස්ථාව වෙත දැනුම් දී තිබුණු බවත්, හිඟ මුදල් පියවීමට ගත් ක්‍රියාමාර්ගය සහ ප්‍රගතිය පිළිබඳ නිරන්තර පසුවිපරම් කරන බවත් හිඟ ආදායම් වාර්තාවේ දක්වා තිබුණත් ඊට අදාළව කිසිදු ප්‍රගතියක් ලබාගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය වීය.

- සී/ස ජාතික කඩදාසි සමාගමට ලබා දී තිබූ රු. මිලියන 50 ක පොළී රහිත ණය මුදලින් කිසිඳු මුදලක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. මෙහිදී ආයතනය සතු වත්කම් විකුණා අදාළ ණය මුදල ගෙවන ලෙස හෝ රජයට දේපල හා වත්කම් කුලිය ලැබෙන පරිදි දිගු කාලීන බදු දීම හෝ සිදු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සමාගමට දැනුම් දී තිබුණු බව හිඟ ආදායම් වාර්තාවේ ඇතුළත්ව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සම්බන්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
- සමාලෝචිත වර්ෂයේ ලංකා සෙරමික් සංස්ථාවට ලබා දී තිබුණු රු.මිලියන 9.40 ක පොළී රහිත මුදලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.මිලියන 8.68 ක් අයවිය යුතුව පැවතුණි. මේ සම්බන්ධව ආයතනය ප්‍රතිව්‍යුහගතකරණය කර එම ණය මුදල් ගෙවීමට කටයුතු කරන මෙන් ලංකා සෙරමික් ආයතනයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණද විගණනයට ඉදිරිපත් කර තිබුණු ලිපිගොනු අනුව ඉදිරි කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.

- සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් වෙත, "Renewable Energy for Rural Economic Development Project (RERED)" ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ රු. මිලියන 1,333.99 ක ණය මුදලින්, 2017 දෙසැම්බර් 31 දින වන විටත් රු.මිලියන 563.02ක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

- ආසියානු සංවර්ධන බැංකුවෙන් ADB 1204 (SRI) SF ගිවිසුමට අනුව 1993 මාර්තු 10 දින ලබාගෙන තිබූ රු. මිලියන 276.75 ක ණය මුදල, මහනගර සහා හා නගර සභා ව්‍යාපෘති සඳහා උපණය ලෙස ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබුණි. මෙම ණය මුදලින් 2017 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 275.58 ක් අයවිය යුතුව පැවතුණි. මෙම හිඟ ණය අයකර ගැනිම සම්බන්ධයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති

රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත එම හිඟ ණය කපාහැරීමට තීරණය වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් මෙම කටයුතු අවසන් කර නොතිබුණි.

- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත ලබාදුන් ණය මුදලෙන්, 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,861.60 ක මුදලක් අයකරගත යුතුව පැවතුණි.

- ණය අංක 2013012 SL යටතේ ලබාගෙන තිබූ ණය මුදලෙන්, මිල්කෝ ආයතනයේ කර්මාන්තශාලා නවීකරණය (1 කොටස ) වෙනුවෙන් අදියර 1 හා 2 යටතේ ලබාදී තිබූ උපණයවලින් 2017 වර්ෂය අවසාන වනවිට රු.මිලියන 2,549.58 ක් හිඟව පැවතුණි.

- හිඟ උපණය පවතින ආයතනවලින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට නීති කටයුතු ගෙන ඇති බව පසුගිය වර්ෂය තුළ විගණනයට දන්වා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගැනීමේ ප්‍රගතියක් නොවූ බව නිරීක්ෂණය විය.

(ii) 2017 වර්ෂයේදී ලබා දී තිබූ උපණය මුදල් (On – Lending) හා වැය විෂයය අංක 2302 (උපණය) යටතේ 2017 වර්ෂයේදී සිදුකර තිබුණු වියදම අතර රු. මිලියන 6,108.56 ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට උපණය ගිවිසුම් 14 කට අදාළව භාණ්ඩාගාර පොත් හා ශේෂ සනාථ කිරීම් අතර රු. මිලියන 422.71 ක අවාසිදායක හා උපණය ගිවිසුම් 04 කට අදාළ රු. මිලියන 237.77 ක වාසිදායක වෙනස්කම් නිරීක්ෂණය විය.

(iv) ගෝල්ඩන් කී තැන්පත්කරුවන් වෙත ගෙවීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත 2302 වැය විෂයය යටතේ 2015 හා 2016 වර්ෂවලදී ලබා දී තිබුණු රු. මිලියන 4,989.90 ක් හා 2017 වර්ෂයේදී ලබා දී තිබුණු රු. මිලියන 2,500 ක් ඇතුළුව එකතුව රු. මිලියන 7,489 ක් වූ උපණය මුදල, උපණය ලෙස ගිණුම්ගත කර නොතිබුණි. මෙම ගනුදෙනු සඳහා උපණය ගිවිසුමකට එළඹීමට අදාළ පාර්ශවයන් දැනුවත් කර තිබූ අතර, ඒ අනුව අදාළ උපණය ගිවිසුම් ලැබීමෙන් පසු මෙය උපණය ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා තිබුණි.

**(ඕ) 30.01.01.00 දරන ආදායම් සංකේතය- විදේශීය ප්‍රදානයන්**

**--------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1994 අප්‍රේල් 20 දින අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ සංශෝධිත මුදල් රෙගුලාසි XI පරිච්ඡේදය අනුව, ශ්‍රී ලංකාවට ලැබෙන විදේශාධාර සම්බන්ධ සියළුම ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කළ යුතු අතර මුදල් රෙගුලාසි 124,127 හා 128 ප්‍රකාරව තම ආයතන වෙත ලැබෙන/ ලබාගන්නා සියලු විදේශාධාර ප්‍රදාන, මුදල් රෙගුලාසි ප්‍රකාර වාර්තා කිරීම, ගිණුම්ගත කිරීම, නිවැරදිව උපයෝජනය කිරීමේ වගකීම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ

නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත පවරා තිබුණි. කෙසේ වුවද, ඉහත තත්ත්වයන් පිළිබඳව සියළුම පාර්ශව දැනුවත් කර තිබුණද, එසේ කටයුතු සිදු නොවන අවස්ථා පවතින බවත් ඒ සම්බන්ධව ලිඛිත තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොමැති බවත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි. මහා භාණ්ඩාගාර අධීක්ෂණය පැවරී ඇති දෙපාර්තමේන්තුව ලෙස එම දෙපාර්තමේන්තුව ආදායම් රැස් කිරීමට අදාළව තවදුරටත් මැදිහත්වීම වැදගත් බව නිරීක්ෂණය විය.

(ii) අදාළ ගණන්දීමේ නිලධාරියා විසින් හෝ පරිබාහිර අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙත මෙවැනි ආධාර ලැබී තිබේද යන වග තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් මෙම ආදායම් සංකේතයට අදාළ සියළුම ප්‍රදානයන් මෙම ගිණුමෙහි ගිණුම්ගත වී තිබුණු බව විගණනයේදී තහවුරු නොවීය.

(iii) සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට ප්‍රදාන ලෙස ලැබී තිබූ රු. මිලියන 8.96 ක් පොදු තැන්පත් ගිණුම් 03 ක රඳවා ගෙන තිබුණු අතර, එම මුදල් අදාළ අරමුණු වෙනුවෙන් නොයොදවා වර්ෂය අවසන් වන විටත් එසේම පැවතුණි.

(iv) ප්‍රදාන ලෙස ලැබී තිබූ රු. මිලියන 1.25 ක් අදාල අරමුණු වෙනුවෙන් නොයොදවා වර්ෂයේදී රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

(v) එක් එක් ව්‍යාපෘති සඳහා විදේශ ආයතන හා රාජ්‍යයන් විසින් ලබාදෙන ලද විදේශ ප්‍රදාන එකී කාර්යයන් සඳහා උපයෝජනය නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. ව්‍යාපෘති 11 කට අදාළ රු. මිලියන 14.87 ක් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවල ඉල්ලීම අනුව සමාලෝචිත වර්ෂය තුළ එම ප්‍රදානකරුවන් වෙත ආපසු යවා තිබුණි.

**2.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 24901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.00 | 7.95 | 4.20 | 4.44 | 24.50 | 19.98 |

**2.8 පොදු තැන්පත් ගිණුම**

පොදු තැන්පත් ගිණුමක 1990 වර්ෂයේ සිට පැවත එන රු. මිලියන 35.12 ක හර ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.9 මානව සම්පත් කළමනාකරණය

### 2.9.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 67 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු. 621,339 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 18 | 6 |
| (ii) | තෘතීය මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතීයික මට්ටම | 82 | 69 | 13 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 20 | 20 | - |
| | එකතුව | 127 | 108 | 19 |

(අ) අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක් සඳහා 2013 පෙබරවාරි 19 දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යටත්ව එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිලධාරියෙකු වැඩබැලීමේ පදනම මත පත්කර තිබුණි. රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ගණකාධිකාරී සේවා අංශය විසින් 2017 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා එම වැඩබැලීමේ පත්වීමේ කාල සීමාව දීර්ඝ කර තිබුණු අතර 2018 සැප්තැම්බර් මාසයේදී 2018 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් 31 දක්වා පමණක් පූර්ණකාලීන වැඩබැලීමක් ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කර තිබුණි.

(ආ) 2017 සැප්තැම්බර් 31 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් ඇතුළුව මුළු පුරප්පාඩු සංඛ්‍යාව 19 ක් වූ අතර, මෙසේ පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් ඒවා පිරවීමේ හෝ නොඑසේනම් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ කාර්ය මණ්ඩල සමාලෝචනය අනුව, 2018 ඔක්තෝබර් 31 දින වන විට අනුමත කාර්ය මණ්ඩලය 123 ක් වන බවත් ඒ අනුව දැනට පුරප්පාඩු 08 ක් පමණක් පවතින බවත් දෙපාර්තමේන්තුව විසින් විගණනයට දන්වා තිබුණි.